Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# තෙවන වාර පරීක්ෂණය 2018

**9 ශ්‍රේණිය** **සිංහල භාෂාව හා සාහිත්‍යය** **කාලය පැය 02 යි**

නම/ විභාග අංකයඃ

## I - කොටස

සැලකිය යුතුයි

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**
- **ඉරි ඇඳි පදයට වඩාත් සමීප අදහස දෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01 කිඹුල් කඳුළු හෙළීමෙන් අනුකම්පාව ලබා ගතහැකි බව සමහරු සිතති.

(i) සත්‍ය ලෙසම හැඬීමෙන් (ii) ඉකිගසා කඳුළු හැළීමෙන්
(iii) බොරුවට හැඬීමෙන් (iv) කිඹුලෙකු ලෙස හැඬීමෙන්

02 නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පදය තෝරා යටින් ඉරක් අඳින්න.

(i) සමස්ත (ii) ප්‍රශ්ථාර (iii) මධ්‍යශ්ථ (iv) ප්‍රසශ්ති

- **ප්‍රශ්න අංක 03 හා 04 ප්‍රශ්නවල ඉරි ඇඳි පද කුමන වියරණ වර්ගයට අයත් වේදැයි තෝරා ඒ යටින් ඉරක් අඳින්න.**

03 මා නිවසට පැමිණෙද්දී නංගී මල් කඩමින් සිටියා ය.

(i) නිපාත පදයකි. (ii) කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා පදයකි.
(iii) මිශ්‍ර ක්‍රියා පදයකි. (iv) අනියමාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා පදයකි.

04 කොන්ත්‍රාත්කරුවා පෙදරේරුවන් ලවා ගෙවල් තනවයි.

(i) විධි ක්‍රියාවකි. (ii) ප්‍රයෝජ්‍ය ක්‍රියාවකි.
(iii) අසම්භාව්‍ය ක්‍රියාවකි. (iv) මිශ්‍ර කියා පදයකි.

05 අකාරාදි පිළිවෙළට යෙදී ඇති පද පේළිය තෝරා ඒ යටින් ඉරක් අඳින්න.

(i) බුත්සරණ, පූජාවලිය, අමාවතුර, සද්ධර්ම රත්නාවලිය
(ii) කලියුගය, යුගාන්තය, ගම්පෙරලිය, මීරිගුව
(iii) රන්තැටියක කඳුළු, සකස්කඩ, හිතෝපදේශය, හීන්සැරය
(iv) හත්පණ, මඩොල්දූව, සිරිත්මල්දම, විරාගය

06 පහත සඳහන් වාක්‍යයෙහි විරාම ලකුණු යොදා තිත් ඉර මත නැවත ලියන්න.

''හඃ හඃ හඃ උඹ දුවලා බේරෙන්න හදනව නේද

......................................................................................................................................................

07 මුලින් දී ඇති පදයට සමානාර්ථවත් පද දෙක බැගින් වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.

(ජලනිධි / අඹ / සිඳු / උදක / අබ / නුඹ)

(අ) ජලය (i) ............................................ (ii) ............................................
(ආ) මුහුද (i) ............................................ (ii) ............................................

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

08 පහත සඳහන් තනි පද වලින් ප්‍රකාශ කෙරෙන අදහස තිත් ඉර මත ලියන්න.

(අ) ආරෝහ පරිණාහ - ..........................................................................................................

(ආ) ජලජ - ..........................................................................................................

09 කාලාර්ථය ඇඟවීම සඳහා යොදාගන්නා නිපාත පද හතරක් වරහන තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.

(අද / කැටුව / යළි / නොහොත් / ඉක්බිති / සඳහා / නිති)

..........................................................................................................

10 පහත සඳහන් පාඨයේ වචන නිවැරදිව වෙන්කර තිත් ඉර මත ලියන්න.

රුවන්වැලිසෑයත්මිරිසවැටියත්දුටුගැමුණුරජතුමාවිසින්කරවනලදදාගැබ්දෙකකි.

..........................................................................................................

11 ''දෑසේ නිල් පැහැය දූවී

සෙමෙන් තුරන් විය නොදූනිම...''

මෙම පාඨයෙහි සඳහන් නාම විශේෂණ හා ක්‍රියා විශේෂණ පදයක් උපුටා දක්වන්න

(අ) නාම විශේෂණ - .................................... (ආ) ක්‍රියා විශේෂණ - ....................................

12 සචේතන රූප ගැන්වූ ගංගාවෝ, රීතීහු යන උක්ත නාම පදවල අනුක්තරූපය පහත තිත් ඉර මත ලියන්න.

(i) .................................................... (ii) ....................................................

13 වරහන තුළින් නිවැරදි පිළිතුර තෝරා හිස්තැන් සම්පූර්ණ කරන්න.

(අ) කෙනෙක් පුස්තකාලයට ගොස් පොත් .............................................. (කියවීය / කියවූහ)

(ආ) මෑණියන්දෑ දරුවන් .............................................. පෝෂණය (කරයි / කරති)

14 පහත දැක්වෙන වචන යොදාගනිමින් අර්ථවත් වාක්‍යය දෙකක් ලියන්න.

(අ) ආවේණික - .............................................. (ආ) අද්විතීය - ..............................................

15 පහත සඳහන් කර්තෘකාරක වාක්‍යය කර්මකාරකයටත්, කර්මකාරක වාක්‍යය කර්තෘකාරකයටත් හරවා තිත් ඉර මත ලියන්න.

(අ) ශිෂ්‍ය නායිකාවක් උදෑසන රැස්වීම මෙහෙයවයි. - ....................................................

(ආ) ගුරුවරුන් විසින් සිසුහු ආරක්ෂා කෙරෙති. - ....................................................

- **ප්‍රශ්න අංක 16 සිට 18 දක්වා ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුරු වරහන තුළින් තෝරා හිස්තැන් සම්පූර්ණ කරන්න.**

(කක්ෂගත / නිර්මාණය / පුළුල් / ස්ථිර / අහේනියට / පරිභෝජනයට)

16 චන්ද්‍රිකාවක් යනු අවකාශය තුළ වස්තුවක් වටා ...................................................... වී ඇති තවත් වස්තුවකි.

17 සාහිත්‍යය නිර්මාණයක අපේක්ෂාව වන්නේ ජීවිතය පිළිබඳ අවබෝධය .................................... කිරීමයි.

18 මුල් යුගයේ වැදි ජනයා යාන්තමට හේන් ගොවිතැන් කළේ ආහාර .............................. පිළියමක් ලෙසිනි.

- **පහත සඳහන් කවිවල හිස්තැන් සම්පූර්ණ කරන්න.**

19 ජාතිය රත් විමනක් වේ

ආගම මිණි පහණක් වේ

....................................................................

....................................................................

20 තෝව උලතියා මරාවි - ....................................................................

කදන් දෙකක් මැදින් තෝව - ....................................................................

දහසක් වද දීල තමයි - තොට මරණෙට යන්න වෙන්නෙ

(ලකුණු 2 x 20 = 40)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**9 ශ්‍රේණිය** **සිංහල භාෂාව හා සාහිත්‍යය - II කොටස**

- **01, 02, 03, 04 යන ප්‍රශ්නවලට හා 05, 06 යන ප්‍රශ්න දෙකෙන් එකකටත් පිළිතුරු සපයන්න.**

01 පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i) (අ) මහාසාර නාට්‍යය රචනා කළ රචකයාගේ නම ලියන්න.
(ආ) ඔහු විසින් සිංහල නාට්‍ය කලාවට දායාද කරන ලද නාට්‍යය දෙකක් නම් කරන්න.

(ii) (අ) පද්‍ය කාව්‍ය ගනයට අයත් සාහිත්‍යාංග දෙකක් නම් කරන්න.
(ආ) දෘෂ්‍ය කාව්‍ය ගනයට අයත් සාහිත්‍යාංගය කුමක් ද?

(iii) (අ) විවිධ ආගම් අදහන අය තුළ සාරධර්ම වර්ධනය කිරීම සඳහා රචිත ග්‍රන්ථ දෙකක් නම් කරන්න.
(ආ) සිංහල සාහිත්‍යයේ උපදේශ ග්‍රන්ථ වශයෙන් සැලකෙන කෘති දෙකක නම් ලියන්න.

(iv) (අ) දිට්හදන කෙටිකතාව රචනා කළ රචකයාගේ නම කුමක් ද?
(ආ) වර්ෂ 1945 දී සන්නිවේදන චන්ද්‍රිකා පිළිබඳ මූලික අදහසක් ප්‍රකාශ කළ අයගේ නම කුමක් ද?

(v) (අ) වර්තමානයේ ''සිලෝන් කැෆ්රිවරුන්'' බහුල ලෙස ජීවත් වන ප්‍රදේශය කුමක් ද?
(ආ) මෙම ජනයා ශ්‍රී ලංකාවට පැමිණීමට හේතු වූයේ කුමක් ද?

(vi) වස් කාලය කේන්ද්‍ර කරගෙන බෞද්ධ ජනතාව සිදුකරන චාරිත්‍ර දෙකක් ලියන්න.

(vii) කුමාරතුංග මුණිදාස මහතා ළමා සාහිත්‍යය වෙනුවෙන් රචිත ගද්‍ය කෘතියක් හා පද්‍ය නිර්මාණයක් නම්කරන්න.

(viii) ශ්‍රී ලංකාවේ සංස්කෘතිය අලළා ආනන්ද කුමාරස්වාමි මහතා ලියූ අගනා ග්‍රන්ථය කුමක් ද?

(ix) ආරාධනා පත්‍රයක් සකස් කිරීමේදී පැහැදිලිව ඇතුළත් විය යුතු අංග තුනක් ලියන්න.

(x) දෙසවනින් අසා රසවිඳිය හැකි ලෙසින් රචනා වූ පුරාතන ගද්‍ය ග්‍රන්ථ දෙකක් නම් කරන්න.

(ලකුණු 1 x 10 = 10)

02 පහත සඳහන් මගපෙන්වන ලද ඡේද අතුරින් එකක් තෝරාගෙන වචන 200 කට නොඅඩු වන සේ රචනාවක් ලියන්න. ගැලපෙන මාතෘකාවක් ද යොදන්න.

(i) මත්ද්‍රව්‍ය භාවිතය දිනෙන් දින ඉහළ යන මාතෘකාවක් බවට පත්ව තිබේ. දිනපතා මහාපරිමානයෙන් අසුවන මත්ද්‍රව්‍ය මෙයට කදිම නිදසුනකි. මත්ද්‍රව්‍යවලට ගොදුරු වන්නේ අපේම අනාගත පරපුරය. මේ සම්බන්ධයෙන් රජය නිසි ක්‍රියාමාර්ග නොගත හොත් තරුණ පරම්පරාවෙන් වැඩි පිරිසක් මත්රකුසාට බිලිවනු ඇත. මත්ද්‍රව්‍ය ව්‍යාප්තිය අවම කර ගැනීමේ වැදගත්කම පිළිබඳව අවධානය යොමු කරමින් රචනාවක් ලියන්න.

(ii) අද වන විට අප විසින් ඉවතලන කසල සමාජ ගැටළුවක් බවට පත්ව තිබේ. ඉවතලන කැළිකසල දිරන, නොදිරන වශයෙන් නිවසේදීම වෙන්කර ගතහොත් දිරන කසල නිවසේදීම කාබනික පොහොර බවට පත්කරගත හැකිය. නොදිරන දෑ ප්‍රතිචක්‍රීකරණයට යොමු කළ හැකිය. නිවසේදීම කසල කළමනාකරණය කර ගැනීමෙන් ඉවතලන කසල සම්පතක් බවට පත්කර ගැනීමේ වැදගත්කම පිළිබඳව විස්තර කරමින් රචනාවක් ලියන්න.

(iii) මාර්ග අනතුරු දවසින් දවස වැඩිවීමෙන් මහමග ජීවිත හානි රැසක් දිනපතා සිදුවේ. මේ සඳහා මහා මාර්ගයේ වාහන අධිකවීම, රියදුරන් මෙන්ම පදිකයන් ද මාර්ග නීති නොපිළිපැදීම ආදී විවිධ හේතු බලපා ඇත. කෙසේවෙතත් දිනෙන් දින ඉහළ යන මාර්ග අනතුරු අවම කිරීමට වැඩපිළිවෙලක් සකස් නොකළහොත් තව තවත් ජීවිත හානි වැළක්විය නොහැකි තත්වයට පත්ව ඇති ආකාරය විස්තර කරමින් රචනාවක් ලියන්න.

(iv) මනුශ්‍ය ඝාතන, පැහැරගැනීම්, මංකොල්ලකෑම්, දිනෙන් දින ඉහළ යන අපරාධ කිහිපයකි. මෙවැනි අපරාධ වර්ධනය වීමෙහිලා ආර්ථික ප්‍රශ්න, මානව සබඳතා පිරිහීම, සමාජ විශමතාව ආදී හේතු ද බලපා තිබේ. මේ පිළිබඳව අවධානය යොමුකරමින් අපරාධ අවම කර ගැනීමට ගතහැකි ක්‍රියාමාර්ග විස්තර කරමින් රචනාවක් ලියන්න. (මුළු ලකුණු 20 යි.)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

03 පෙළ පොතේ ඇතුළත් පාඩම් ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) ''දැන් අපට පක්ෂ නෑ මේ රටේ කිසි කෙනෙක්. ටික කලෙක හිටන් මට ඒක තේරුනා''

(අ) මෙම ප්‍රකාශය ඇතුළත් පාඩමේ නම කුමක් ද?

(ආ) මෙම ප්‍රකාශය කවුරුන් විසින් කාහට කියන ලද්දක් ද?

(ii) ''ඔයා හරි හපනා මං ඔයාට සුභ පතනවා''

(අ) මෙම ප්‍රකාශය ඇතුළත් කෙටිකතාවේ නම ලියන්න.

(ආ) මෙම ප්‍රකාශය කවුරුන් විසින් කාහට පවසන ලද්දක් ද?

(iii) ''එහෙනම් ඔහේ මුන්නැහැව ඒ කාලේ ඉදල දන්නව ?''

(අ) මෙම ප්‍රකාශය ඇතුළත් පාඩමේ නම ලියන්න.

(ආ) මෙම ප්‍රකාශය කළේ කවුද? කාහටද?

(iv) ''මෙලෝ පරලෝ දෙකින්ම කිසිත්ම ප්‍රයෝජනයක් නැති අකාරිය නිසා වියදම් කොට නසා පියා දැන් සිඟාකා ඇවිදිති''

(අ) මෙම ප්‍රකාශය ඇතුළත් මුල් කෘතියේ නම ලියන්න.

(ආ) ඉහත ප්‍රකාශය කවුරුන් විසින් කාහට පවසන ලද්දක් ද?

(v) ''දැන් ඉතින් මට ප්‍රීතියෙන් මගේ අවසන් ගමන යා හැකියි''

(අ) ඉහත ප්‍රකාශය ඇතුළත් පාඩමේ නම ලියන්න.

(ආ) මෙම ප්‍රකාශය කවුරුන් විසින් කාහට පවසන ලද්දක් ද? (ලකුණු 2 x 5 = 10)

04 ඔබ පාසලේ ශිෂ්‍ය නායක / නායිකා මණ්ඩලය සඳහා 2019 වර්ෂය සඳහා නවක ශිෂ්‍ය නායක / නායිකාවන් තෝරා පත්කර ගැනීම සඳහා ඒ කෙරේ කැමැත්තක් දක්වන ශිෂ්‍ය / ශිෂ්‍යාවන්ගෙන් අයදුම්පත් කැඳවා තිබේ. මේ සඳහා ඔබද අයදුම් කරුවෙකු යැයි සිතා තම ජීවදත්ත තොරතුරු හා විශේෂ දක්ෂතා ඇතුළත් කර ආකෘති පත්‍රයක් සකස් කර සම්පූර්ණ කරන්න. (ලකුණු 10 යි.)

05 පහත සඳහන් ඡේදය වචන 25-30 ක් පමණ වන සේ සාරාංශ කර ලියන්න.

අවට බලන ඔහුට, ඒ රෑ සිය නගරය ගිනිගෙන දැවෙන හැටි මොනවට පෙනෙන්නට විය. නගර වැසියන් වෙඩි කා ගෙන මරහඬ දෙමින් නැසෙන සැටිත්, ගැහැණුන් සහ ළමයින් සැනින් සිඳ බිඳ ගිය අත් පා ඇතිව වළපෙන සැටිත් පෙනෙන්නට විය. අන්ධකාරය මේ වෙලේ ඔවුනට මහත් පිටුවහල් විය. පිස්සු බල්ලන් මෙන් කිසි ඉවක් බවක් නැතිව ගෙවල් ගිනි තැබීමත් දුබල ළමයින් හා ගැහැණුන් කඩුගෑමත්, වස්තු කොල්ලකෑමත්, විනෝදය කොටගෙන නොයෙක් සැහැසිකම් කරන පරංගි හේවායන් මග අරිමින් යුහුව යුහුව නගරයෙන් පිටත්ව යාමට ඔවුනට අන්ධකාරය මහෝපකාරී විය. (ලකුණු 10 යි.)

06 පහත සඳහන් කවිපෙළ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

පරසිඳු මෙ මිහිතල
මධුරට පුරෙහි සාගල
මධු රජුට බෝ බල
දුවක් විය පබවති නම් දුල

සිව් රියන් ගෙය කුස
බැද හිඳින සඳ එ දිගැස
දුරුවෙයි අඳුරු රැස
මිණි පහන් ගණනක් නැගු ලෙස

එකුමරි වසන තැන
රජ කුමරියෝ ඇතැත් වෙන
නොම දිලෙත් රුසිරෙන
දිනිඳු අබියස ලුපනන් මෙන

(i) මෙහි සඳහන් කුමරිය වාසය කළ රට හා නගරය නම් කරන්න.

(ii) මෙම කුමරියගේ පියාගේ නම ලියන්න.

(iii) කවි පන්තියේ ඇතුළත් උපමා දෙකක් තෝරා ලියන්න.

(iv) රාජකුමාරිකාවගේ හා සෙසු කුමාරිකාවන් අතර ඇති වෙනස කුමක් ද?

(v) පරසිඳු, දිනිඳු යන පදවල අර්ථය ලියන්න. (ලකුණු 10 යි.)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com



## පිළිතුරු පත්‍රය - I කොටස

(01) iii (02) (අ) i (ආ) iii (03) ii (04) ii (05) iii
(06) හඃ ! හාඃ ! හඃ ! උඹ දුවල බේරෙන්න හදනව නේද ?
(07) (අ) i. අඹ ii. උදක (ආ) i. ජලනිධි ii. සිඳු
(08) (අ) උසට ගැලපෙන මහතින් යුත් (ආ) දියෙහි උපන්නා වූ (ජලයෙහි හටගත්)
(09) අද, යලි, ඉක්බිති, නිති
(10) රුවන්මැලි සෑයත් මිරිසවැටියත් දුටුගැමුණු රජතුමා විසින් කරවන ලද දාගැබ් දෙකකි.
(11) (අ) නිල් (ආ) සෙමෙන්
(12) i. ගංගාවන් ii. රීතීන්
(13) (අ) කියවූහ (ආ) කරති
(14) නිවැරදි අර්ථවත් වාක්‍ය දෙකක් ලියා ඇත්නම් ලකුණු දෙන්න.
(15) වාක්‍ය නිවැරදිව ලියා ඇත්නම් ලකුණු දෙන්න.
(16) කක්ෂගත (17) පුළුල් (18) අහේනියට (19) එය රැක ගන්නට මෙලොවේ සමත් වෙතොත් පුත නුඹ වේ
(20) නැතිනම් පෙති ගහල දාවි
බැඳල ඉරල දාවි දෙකට

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

01. (i) (අ) එදිරිවීර සරච්චන්ද්‍ර මහතා
(ආ) මනමේ, සිංහබාහු, පේමතො ජායති සෝකෝ ආදී ඔහුගේ නාට්‍ය නිර්මාණවලට ලකුණු දෙන්න.
(ii) (අ) සිව්පද, නිදහස් පද්‍ය, ගී කාව්‍ය, සිලෝ කාව්‍ය (ආ) බලා රසවිඳින නාට්‍ය
(iii) (අ) තෙරුක්කුරල්, පෙරියපුරාණම්, කුරාණය, බයිබලය
(ආ) ලෝවැඩ සඟරාව, ලෝකොපකාරය, සුභාෂිතය
(iv) (අ) ජේ. සී. පී. එස්. සිරිවර්ධන මහතා (ආ) ආතර් සී. ක්ලාක් මහතා
(v) (අ) පුත්තලම, සිරම්බිඅඩිය ප්‍රදේශය
(ආ) දෙවන ලෝක යුද්ධ සමයේ යුධ සෙබළුන් හා කඳවුරුවල ආවතේව කරුවන් ලෙස සේවය කිරීම
(vi) වස් ආරාධනාව, කඨින චීවර පූජාව, කඨින පෙරහැර පැවැත්වීම ආදිය
(vii) හීන්සැරය, හත්පණ, මඟුල්කෑම ආදිය (ගද්‍ය)
භාවාගේ වග, නැළවිල්ල, සිරිමත්, වෙළෙන්දි ආදිය (පද්‍ය)
(viii) මධ්‍යකාලීන සිංහල කලා
(ix) එහි අරමුණු, පැවැත්වෙන දිනය හා වේලාව, පැවැත්වෙන ස්ථානය
(x) අමාවතුර, බුත්සරණ, පූජාවලිය, සද්ධර්ම රත්නාවලිය, ජාතක කතා පොත (ලකුණු 2 x 10 = 20)

02 කරුණු ගලපා ලියා ඇති ආකාරය අනුව ලකුණු පිරිනමන්න. පහත ආකෘතිය සැලකිල්ලට ගන්න.
සාරවත් භාවය මාතෘකාවද ඇතුළත්ව ලකුණු 06 යි.
සංවිධානාත්මක බව, නිර්මාණශීලී බව හා ස්වීයත්වය ලකුණු 10 යි.
ශිල්පීය දක්ෂතා, ඡේද බෙදීම ලකුණු 04 යි. (මුළු ලකුණු 20 යි.)

03 (i) (අ) මහාසාර පළඳනාව (ආ) බිසව - රජුට
(ii) (අ) මීටර් 100 (ආ) උල් සපත්තුකාරයා විසින් මුදලිහාමිට
(iii) (අ) දිට්ඨ දාන (ආ) මුල් ගුරුතුමා විසින් සුගුණපාල ගුරුමහතාට
(iv) (අ) සද්ධර්මරත්නාවලිය (ආ) බුදුන් වහන්සේ විසින් ආනන්ද තෙරුන්ට
(v) (අ) ශ්‍රී පාදය වැන්ද වූ හැටි (ආ) මැණියන් විසින් - බාල පුතාට (ලකුණු 2 x 5 = 10)

04 පහත ආකෘතය සැලකිල්ලට ගෙන සුදුසු පරිදි ලකුණු ප්‍රදානය කරන්න.
ආකෘති පත්‍රය සැකසීම ලකුණු 05 යි.
කරුණු ඇතුළත් කිරීම ලකුණු 03 යි.
ශිල්පීය දක්ෂතා ලකුණු 02 යි. (මුළු ලකුණු 10 යි.)

05 සාරාංශය සඳහා ලකුණු පිරිනැමීම
අන්තර්ගතය - ප්‍රධාන අදහස් සඳහා ලකුණු 06 යි.
වචන ගණන - (25 - 30 අතර තිබීම සෑහේ) ලකුණු 02 යි.
ශිල්පීය දක්ෂතා - වියරණ, අත්අකුරු, විරාම ලක්ෂණ ලකුණු 02 යි. (ලකුණු 10 යි.)

06 (i) මධුරට - සාගල නගරය (ii) මධු රජ
(iii) මිණි පහන් ගණනක් නැගු ලෙස / දිනිඳු අබියස ලු පහන් මෙන
(iv) රූපය ලස්සන නොවීම (v) ප්‍රසිද්ධ - සූර්යා (ලකුණු 10 යි.)